Sinhalese - සිංහල

**ඉවත්කරගැනීමේ දැන්වීම**

**ඕස්ට්‍රේලියාවේ ඉහල උසාවිය**

**නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටින පුද්ගලයින් විසින් සරණාගත කණ්ඩායම් ක්‍රියාවක් වෙනුවෙන් කරන නීතිමය කටයුත්තකට මැදිහත්වීම**

**DBE17 (ඔහුගේ නීතිමය භාරකරු *Marie Theresa Arthur*) එරෙහිව ඕස්ට්රේලියානු ආණ්ඩුව**

**(2019 යේ VID1392)**

**අවධානය:**

ඔබ මෙම දැන්වීම ප්‍රවේශමෙන් කියවිය යුතුයි.

වැඩකරන දින දෙකක් හෝ ඊට වඩා ඔබ ඕස්ට්‍රේලියාවේදී **2011 අගෝස්තු 27 සහ 2020 පෙබරවාරි 25** අතර කාලයේදී රඳවා තබාගෙන සිටියානම් ඔබ සහ ඔබේ කාලයෙහි සංක්‍රමනිකයින් රඳවා තබාගත් ස්ථානයෙහි සිටි අනිකුත් පුද්ගලයින් සඳහා උසාවි නඩුවක් ආරම්භ කර ඇත.

ඔබ මෙම නඩුව වෙනුවෙන් පෙනී සිටීමට උවමනාදැයි ඔබ තීරණය කිරීමට අවශ්‍ය නිසා උසාවිය නියමකළ මෙම තොරතුරු අප ඔබට එවන්නෙමු.

ඔබට මෙම දැන්වීම පිළිබඳව ප්‍රශ්ණ තිබේනම් ඔබ නීති උපදෙස් ලබාගත යුතයි. ඔබ උසාවියට කතා **නොකල** යුතුයි.

ඔබ ඉංග්‍රීසි කියවන්නේ නැතිනම්, මෙම දැන්වීම අනෙකුත් භාෂා වලින් ලබාගතහැකි පහත සඳහන්

"නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටින පුද්ගලයින් විසින් සරණාගත එකතුවක් වෙනුවෙන් කරන නීතිමය කටයුත්තකට මැදිහත්වීම" යටතෙහි ඇති https://www.mauriceblackburn.com.au/class-actions/current-class-actions/unlawful-detention-of-people-seeking-asylum-class-action/ අන්තර් ජාලයට පිවිසෙන්න. එසේම ඔබට මෙම දැන්වීමෙහි ඔබේ භාෂාවෙන් ඇති කොපියක් දුරකථන අංක 1800 930 956 කතාකර Maurice Blackburn Lawyers සම්බන්ධ කරගැනීමෙන් හෝ asylumseekerclassaction@mauriceblackburn.com.au ඊමේල් කර හෝ ඉල්ලා සිටින්න.

1. **මට මෙය ලැබෙන්නේ ඇයි?**

මෙම දැන්වීම උසාවි නඩුවක් ගැන වන අතර එය පටන්ගනු ලැබුවේ " **DBE17** " නමින් හඳුන්වන පුද්ගලයා විසින්ය. නීතිමය හේතු මත අපට ඔහුගේ නියම නම පාවිච්චි කල නොහැක. ඔහුගේ වයස අවුරුදු 18 ට පහල වන නිසා ඔහු වෙනුවෙන් මෙම නඩුව පටන්ගත්තේ ඔහුගේ නීතිමය භාරකරු ***Marie Theresa Arthur*** විසින්ය.

නඩුව ඕස්ට්‍රේලියාවේ ඉහල උසාවියෙහි තිබේ. එය ඕස්ට්‍රේලියාවේ ආණ්ඩුවට එරෙහිවය. (**the "Australian Government"**).

DBE17 පවසා සිටිනවා ඔහු සහ ඔහුගේ මිනිසුන් ("**group members** ") ඕස්ට්‍රේලියාවේ සංක්‍රමනකයින් රඳවා තබාගත් ස්ථානයෙහි 2011 අගෝස්තු 27 සහ 2020 පෙබරවාරි 25 අතර කාලයේදී

ඕස්ට්‍රේලියානු ආණ්ඩුව විසින් කල *නීතිවිරෝධී* රඳවා තබා ගැනීමක් බවට. ඔබට මෙම දැන්වීම ලැබෙන්නේ ඔබ 2011 අගෝස්තු 27 සහ 2020 පෙබරවාරි 25 අතර කාලයේදී ඕස්ට්‍රේලියාවේ සංක්‍රමනකයින් රඳවා තබාගත් ස්ථානයෙහි ඔබ සිටිය නිසා වෙන්නට හැකිය. එමනිසා ඔබ කණ්ඩායම් සාමාජිකයෙක් විය හැකිය.

## 2. ඕස්ට්රේලියානු නීති පද්ධතිය

ඕස්ට්රේලියානු නීති පද්ධතිය පුද්ගලයෙකුට (**ඉල්ලුම්කරුවෙක්**) උසාවි නඩුවක් ආරම්භ කරන්න ඉඩදෙනවා වෙනත් පුද්ගලයෙකුට, කොම්පැණියකට හෝ ආණ්ඩුවට (**වගඋත්තරකරුවෙක්**) විරුද්ධව මුල්‍යමය වන්දියක් සඳහා, ඉල්ලුම්කරු විශ්වාස කරනවානම් වගඋත්තරකරු විසින් කිසියම් තුවාල කිරීමක් හෝ අලාභයක් සිදුකර තිබීම නිසා ඔහු හෝ ඇය පීඩා විඳ තිබෙන බවට, සහ වග උත්තරකරුට විරුද්ධව ඉල්ලුම්කරුගේ හිමිකම් සහ පැමිණිලි සඳහා නිසි පදනමක් ඇති බවට.

ඕස්ට්රේලියාවේ සියලුම උසාවි පාර්ලිමේන්තුවෙන් සහ පාර්ලිමේන්තු සාමාජිකයින්ගෙන් නිදහස්ය. උසාවිවලට ඔවුන් අනුගමනය කරන පටිපාටි සඳහා පැහැදිලි නීති ඇත. මෙයට සාක්කි පිලියෙල කිරීම සඳහා නීති සහ නීතියට අනුව උසාවි නඩුවක් තීරණය කිරීම පිණිස එම සාක්කිවලට නීති මුලධර්ම යොදාගැනීමත් ඇතුලත්ය.

## 3. කණ්ඩායම් ක්රියාව යනු කුමක්ද?

මෙම උසාවි නඩුව "**කණ්ඩායම් ක්රියාවකි**". කණ්ඩායම් ක්රියාවක් යනු එක් පුද්ගලයෙක් විසින් (ඒ ඉල්ලුම්කරු වෙයි) මිනිසුන් කණ්ඩායමක් සඳහා (ඒ කණ්ඩායම් සාමාජිකයින් වෙයි) තවත් පුද්ගලයෙකුට හෝ ආයතනයකට (ඒ වගඋත්තරකරු වෙයි) විරුද්ධව පටන්ගෙන ඇති උසාවි නඩුවකි.

කණ්ඩායම් ක්රියාවකදී, ඉල්ලුම්කරුට සහ කණ්ඩායමේ සාමාජිකයින්ට වගඋත්තරකරුට විරුද්ධව සමාන හිමිකම් හෝ පැමිණිලි තිබේ.

## 4. කණ්ඩායම් ක්රියාව කුමක් ගැනද?

මෙම කණ්ඩායම් ක්රියාවේදී, ඕස්ට්රේලියානු ආණ්ඩුව විසින් පුරවැසියන් නොවන නීති විරෝධී රඳවා තබාගැනීම නීත්‍යානුකූල යැයි DBE17 පවසයි මෙසේනම් පමණක් :

1) අරමුණු සඳහා හැම අවස්ථාවේම රඳවා තබාගැනීම:
    a) ඕස්ට්රේලියාවෙන් ඉවත්කිරීම, කලාපීය සැකසුම් රටකට ඉවත්කිරීම ඇතුළුව (මේ අවස්ථාවේදී නාරු, නැත්නම් පැපුවා නිව් ගිනියා);
    b) වීසා එකක් සඳහා ඉල්ලුම් පත්රයක් ලැබීම, විමර්ශනය කිරීම සහ තීරණය කිරීමෙන් නීති විරෝධී පුරවැසියන් නොවෙන පුද්ගලයින්ට ඕස්ට්රේලියාවට ඇතුළුවීමට සහ නැවතීමට අවසර දීම: හෝ
    c) වීසා එකක් සඳහා වලංගු ඉල්ලුම් පත්රයකට අවසර දීමට තීරණය කිරීම
2) රඳවා තබාගැනීමේ අදාල අරමුණ ඉටුකිරීමට හැකියාව තිබීම
3) රඳවා තබාගැනීමේ අදාල අරමුණ හැම විටම සාධාරණ ලෙස ප්රායෝගිකව කරගෙන යාමට කටයුතු කිරීම

ඔහු සහ කණ්ඩායමේ සාමාජිකයන්ව ඕස්ට්රේලියානු ආණ්ඩුව විසින් අදාල හේතු එකකට හෝ දෙකට නීතිවිරෝධීව රඳවා තබාගෙන සිටිබවට DBE17 ප්රකාශ කරයි:

a) DBE17 සහ එම කණ්ඩායම් සාමාජිකයන් ඕස්ට්‍රේලියාවට පැමිණියේ 2012 අගෝස්තු 12 වෙනිදාට පසුව සහ නාරු සහ පැපුවා නිව් ගිනියාවලට ගෙනයාමට අවශ්‍යවුනත් නීතිවිරෝධීව තබාගෙන ඇත්තේ එක්කෝ:

i. එම පුද්ගලයින් එම ස්ථානවලට රැගෙනයාම සාධාරණ ලෙස ප්‍රායෝගික හෝ ඉටු කිරීමට හැකියාවක් නොවීම; හෝ

ii. පුද්ගලයින් එම ස්ථානවලට රැගෙන ගොස් තිබුනත් ඉතා ඉක්මනින් සාධාරණ ලෙස ප්‍රායෝගිකව නොවීම

b) ඕස්ට්‍රේලියානු ආණ්ඩුව DBE17 ට සහ කණ්ඩායම් සාමාජිකයන්ට ඕස්ට්‍රේලියාවේ රැඳී සිටීමට වීසා ලබාදීම සඳහා තීරණය කිරීමට දිගු කාලයක් ගෙන ඇත.

DBE17 සහ කණ්ඩායම් සාමාජිකයන් නීති විරෝධීව රඳවා තබාගත්බවට සහ කණ්ඩායම් ක්‍රියාව පාලනය කල බවට ඕස්ට්‍රේලියානු ආණ්ඩුව එකඟ නොවෙයි.

**5. ඔබ කණ්ඩායම් සාමාජිකයෙක්ද?**

ඔබ කණ්ඩායම් සාමාජිකයෙක් ඔබ:

a) ඕස්ට්‍රේලියාවේ ප්‍රදේශවල හෝ ඕනෑම ප්‍රදේශයක 2011 අගෝස්තු 27 සහ 2020 පෙබරවාරි 25 අතර කාලයේදී වැඩකරන දින දෙකකට වඩා ආගමන රැඳවුම් ස්ථානයක රඳවාගෙන සිටියේනම්.

b) ඔබේ ඕස්ට්‍රේලියානු වීසා අවලංගුවූ නිසා රඳවාගෙන <u>නොසිටියානම්</u>.

c) නොගියානම්, ඕස්ට්‍රේලියාවට පැමිණි පසු ඕනෑම වෙලාවක, ස්වේච්ඡාවෙන් ඔබේ උපන් රටට හෝ ඕස්ට්‍රේලියාවට පැමිණීමට පෙර පදිංචිවී සිටි ඕනෑම රටකට නැවත නොගියානම්.

d) 2011 අගෝස්තු 27 සිට ඕනෑම වෙලාවක ඕස්ට්‍රේලියාවෙන් ඔබේ උපන් රටට හෝ ඔබ පදිංචිවී සිටි වෙනත් ඕනෑම රටකට ඉවත් නොකර සිටීම සහ නැවත ඕස්ට්‍රේලියාවට පැමිණ නොසිටීම;

e) ඔබගේ වීසා කල් ඉකුත්වූ නිසා රඳවා තබා නොගෙන සිටීම සහ ඔබ වලංගු වීසා එකක් නොමැතිව ඕස්ට්‍රේලියාවේ නතර නොවී සිටීම, ඔබට පසුව ආරක්ෂණ වීසා එකක් ප්‍රදානය කිරීමක් හැරෙන්නට;

f) කිසිම අවස්ථාවක, ඔබට, the *Australian Security Intelligence Organisation Act 1979* (Cth) යටතේ අහිතකර ආරක්ෂක තක්සේරුවක් නොලැබුනේනම්.

ඔබට සහතික නැතිනම් ඔබ කණ්ඩායම් සාමාජිකයෙක්ද නැද්ද කියලා, ඔබ Maurice Blackburn නීතිඥවරුන් 1800 930 965 අංකයෙන් හෝ asylumseekerclassaction@mauriceblackburn.com.au ඊමේලයෙන් සම්බන්ධ කරගෙන ප්‍රමාද නොවී ඔබේ නීති උපදෙස් ලබාගන්න.

6. **මම කණ්ඩායම් සාමාජිකයෙක් සහ මට කණ්ඩායම් ක්‍රියාවෙහි රැඳී සිටීමට අවශ්‍යයි - මම කුමක් කලයුතුද?**

ඔබට කණ්ඩායම් ක්‍රියාවෙහි රැඳී සිටීමට අවශ්‍ය නම් දැන්මම ඔබ කිසිදෙයක් කිරීමට අවශ්‍ය නැත.

කෙසේ වෙතත්, ඔබට හැකියි ඔබව සම්බන්ධ කරගතහැකි විස්තර Maurice Blackburn Lawyers' වෙබ් අඩවියේ, DBE17 වෙනුවෙන් නීතිඥවරුන් හමුවී, https://www.mauriceblackburn.com.au/class-actions/current-class-actions/unlawful-detention-of-people-seeking-asylum-class-action/ ලියාපදිංචි වෙන්නට. මෙමගින් කණ්ඩායම් ක්‍රියාව ගැන ඕනෑම අනාගත දැන්වීමක් ඔබගේ සුදුසුම ලිපිනයට, ඊමේලයට හෝ ජංගම දුරකථන අංකයට එවිය හැකියි.

**ඔබ මෙම කණ්ඩායම් ක්‍රියාවෙහි සිටීමට දැනට මුදල් ගෙවීමක් කිරීම අවශ්‍ය නැත**: වැඩිදුර විස්තර "8" කොටසින් බලාගන්න. " මම කණ්ඩායම් ක්‍රියාවෙහි සිටිනම් මම කිසියම් මුදලක් ගෙවීමට අවශ්‍යද?"

කණ්ඩායම් ක්‍රියාවෙහි සිටීම ඔබට තිබෙන කිසිම වීසා එකකට බලපාන්නේ නැත. ඔබේ වීසා එක ගැන කිසියම් ප්‍රශ්නයක් ඇත්නම් ඔබ සංක්‍රමණ නියෝජිතයෙක්ක් මුණගැසිය යුතුයි.

ඔබ කණ්ඩායම් ක්‍රියාවෙහි සිටියිනම්, ඔබ කණ්ඩායම් ක්‍රියාවෙහි ප්‍රථිපලය සමග “බැඳී” සිටිනු ඇත. මෙහි තේරුම නම් ඔබ කණ්ඩායම් ක්‍රියාව දිනුවිට හෝ පැරදුනවිට හෝ සමතයකට පත්කලවිට ඔබට ප්‍රථිපලය බාරගැනීමට සිදුවෙන බවයි.

a) කණ්ඩායම් ක්‍රියාව සාර්ථක වුණහොත්, ඔබට නීතිමය ප්‍රථිපලය හෝ නිරවුල් කරගැනීමේ ගණන බෙදාගන්නට හිමිකම් කීව හැකියි. එනම්, ඔබට මුදල් ලබාගත හැකියි.
b) කණ්ඩායම් ක්‍රියාව සාර්ථක නොවුනහොත් හෝ බලාපොරෝත්තුවුන ප්‍රමාණයට වඩා අඩුවුනහොත් ඔබට මුදල් නොලැබී යාමට හෝ අඩුවෙන් ලැබීමට පුළුවන් වෙයි. කෙසේවෙතත් ඔබ මුදල් ගෙවීමට අවශ්‍ය නැත.

කණ්ඩායම් ක්‍රියාව සාර්ථක වුනත් නැතත්, ඔබ එහි සිටිනවානම්, ඉහත අංක "3. කණ්ඩායම් ක්‍රියාව යනු කුමක්ද?" යන්නෙහි පැහැදිලිකළ නීතිවිරෝධීව රඳවා තබාගැනීමට සමාන පැමිණිලි සඳහා ඕස්ට්‍රේලියානු ආණ්ඩුවට විරුද්ධව පසුකාලයේදී ඔබේම උසාවි නඩුවක් පටන්ගත නොහැකි වෙයි.

7. **මම කණ්ඩායම් සාමාජිකයෙක් නමුත් කණ්ඩායම් ක්‍රියාවෙහි රැඳී සිටීමට අවශ්‍ය නැත - මම කුමක් කල යුතුද?**

ඔබට කණ්ඩායම් ක්‍රියාවෙහි රැඳී සිටීමට අවශ්‍ය නැතිනම් ඔබ ඕස්ට්‍රේලියාවේ ඉහල උසාවියට පැවසිය යුතුයි. මෙය "ඉවත් කරගැනීම" යනුවෙන් හඳුන්වයි.

ඔබ ඉවත් කරගන්නවානම්:

a) ප්‍රතිපලය කුමක් වුවද මෙම කණ්ඩායම් ක්‍රියාවෙන් කිසිම මුදලක් නොලැබෙනු ඇත;

b) කණ්ඩායම් ක්රියාවෙහි ප්රතිපලයෙන් බැඳී නොසිටින අතර ඔබට හැකිවෙනවා, ඔබට අවශ්යනම් ඕස්ට්රේලියානු ආණ්ඩුවට විරුද්ධව ඉහත අංක 3 න් පැහැදිලිකල නීතිවිරෝධීව රඳවා තබාගැනීමට සමාන පැමිණිලි සඳහා ඔබේම උසාවි නඩුවක් පටන් ගැනීමට, ඔබ නඩුවෙහි සපයා ඇති නීතිමය කාල සීමාවක් ඇතුලතදී පටන් ගතයුතුය.

ඔබට අවශ්යනම් ඕස්ට්රේලියානු ආණ්ඩුවට විරුද්ධව ඔබේ උසාවි නඩුවක් ගෙන ඒමට, ඔබේ නඩුව ගැන නීතිඥවරයෙකුගෙන් උපදෙස් ලබාගත යුතුවෙන අතර ඉවත් කරගැනීමට **පෙර** ඉල්ලුම්කළ හැකි කාලය සීමා සහිත වෙයි.

**ඔබට අවශ්යනම් ඉවත් කරගැනීමට,** මෙම දැන්වීම අවසානයේදී ඔබ ඉවත් කරගැනීමේ පෝරමය සම්පූර්ණ කලයුතු අතර පෝරමය ඊමේල් හෝ තැපැල් කරන්න:

The Registrar
Federal Court of Australia
Victorian District Registry
305 William Street
Melbourne VIC 3000
or
vicreg@fedcourt.gov.au

### වැදගත්:

ඉවත් කරගැනීමේ පෝරමය 2020 දෙසැම්බර් 4 වෙනිදාට පෙර රෙජිස්ට්රාර්ට ලැබිය යුතුයි. නොඑසේනම්, ඔබේ ඉවත් කරගැනීම ගණන් නොගන්නා අතර මෙම කණ්ඩායම් ක්රියාවෙහි කණ්ඩායම් සාමාජිකයෙක් වශයෙන් ඔබ තවදුරටත් සිටිනු ඇත.

සෑම කණ්ඩායම් සාමාජිකයෙක්ම ඉවත් කරගැනීමේ පෝරමයක් වෙන වෙනම පිරවිය යුතුයි.

## 8. කණ්ඩායම් ක්රියාවෙහි රැඳී සිටින්නේ නම් මම කිසියම් මුදලක් ගෙවීමට අවශ්යද?

ඔබ කණ්ඩායම් ක්රියාවෙහි රැඳී සිටීමට දැනට කිසිවක් ගෙවීමට අවශ්ය නැත.

මෙම කණ්ඩායම් ක්රියාව කරගෙන යන්නේ 'කොන්දේසි පදනම' යටතේ Maurice Blackburn Lawyers විසින් වෙයි. මෙහි තේරුම නම් කණ්ඩායම් ක්රියාව සාර්ථක වුවහොත් පමණක් ඔවුන්ට ගෙවීමට ඇතිබවයි.

කණ්ඩායම් ක්රියාව සාර්ථක වුවහොත්, Maurice Blackburn Lawyers විසින් ඔවුන්ගේ නීති ගාස්තු මුදල සීමාකර ඕස්ට්රේලියානු ආණ්ඩුවෙන් හෝ වෙනත් කිසියම් පාර්ශවයකගෙන් අයවිය යුතු මුදල ලබාගනියි.

ඔබට අවශ්ය නම් ඔබේ අයිතිවාසිකම අවසන්කිරීම සඳහා පුද්ගලික නීති උපදෙස් ලබාගැනීමට නඩුව අවසානයේදී කිසියම් මුදලක් ගෙවීමට ඔබට අවශ්ය වෙනු ඇත. ඔබට Maurice Blackburn Lawyers හෝ වෙනත් නීතිඥවරුන් මෙම කාර්යය ඔබ වෙනුවෙන් කිරීමට යොදාගත හැක. ඔබට පුළුවන්

කණ්ඩායම් ක්රියාව සම්බන්ධව කටයුතු කරන Maurice Blackburn Lawyers ලාගේ කොන්දේසිවල කොපියක් ඔවුන්ව සම්බන්ධ කරගැනීමෙන් ලබාගැනීමට.

**9. ඔබට මෙම අදාල තොරතුරු ලබාගත හැක්කේ කොහෙන්ද?**

අයිතිවාසිකම් ප්රකාශනය ඇතුළුව, අදාල තොරතුරුවල කොපි, සහ ආරක්ෂාව, ලබාගත හැකියි:

(a) ඒවා https://www.mauriceblackburn.com.au/class-actions/current-class-actions/unlawful-detention-of-people-seeking-asylum-class-action/ කොපි කරගත හැකියි;

(b) ඒවා Maurice Blackburn Lawyers ලාගේ කාර්යාලයේදී පෙරවරු 9 සිට පස්වරු 5 දක්වා කාලයේදී පරීක්ෂා කරගන්න, සම්බන්ධ කරගත හැකි තොරතුරු www.mauriceblackburn.com.au වෙබ් අඩවියෙන් හෝ 1800 930 956 ට කතාකර ලබාගත හැකියි;

(c) ඉහල උසාවියේ දිස්ත්රික්ක ලේඛනයට කතාකර (සම්බන්ධ කරගත හැකි තොරතුරු www.fedcourt.gov.au වලින් ලබාගත හැකිය) සහ අදාල පරීක්ෂා කරන ගාස්තු ගෙවීමෙන්; හෝ

(d) ඒවා ඉහල උසාවියේ https://www.fedcourt.gov.au/law-and-practice/class-actions/class-actions. වෙබ් අඩවියෙන් පරීක්ෂා කිරීමෙන්.

කරුණාකර ඉහත සඳහන් කරුණු පරිස්සමින් සලකා බලන්න. ඔබට යම් දෙයක් පිලිබඳව විශ්වාස නැතිනම්, ඔබ 1800 930 956 අංකයෙන් Maurice Blackburn Lawyers හෝ asylumseekerclassaction@mauriceblackburn.com.au වෙබ් අඩවිය සම්බන්ධ කරගත යුතුයි හෝ ඔබ විසින් නීති උපදෙස් සොයාගත යුතුයි. ඔබ ඔබේ තීරණය ගැනීම අතපසු නොකළ යුතුයි.

Form 21
Rule 9.34

**OPT OUT NOTICE**

No. VID1392 of 2019

**ඇමුණුම**

කණ්ඩායම් ක්‍රියාවෙහි කෙනෙක් වීමට අවශ්‍ය නැතිනම් පමණක් මෙම පෝරමය පාවිච්චි කරන්න

පෝරම 21
9.34 නීතිය

**ඉවත්කරගැනීමේ දැන්වීම**

**No. 2019 VID1392**

Federal Court of Australia
District Registry: Victoria
Division: General

**DBE17** (ඔහුගේ නීතිමය භාරකරු **Marie Theresa Arthur** විසින්)

ඉල්ලුම්කරු

**ඕස්ට්‍රේලියානු ආණ්ඩුව**

වගඋත්තරකරු

වෙතට: The Registrar
Federal Court of Australia
VIC District Registry
Owen Dixon Commonwealth Law Courts Building
305 William Street
Melbourne VIC 3000

[ඔබේ සම්පූර්ණ නම], කණ්ඩායම් ක්‍රියාවෙහි පන්ති සාමාජිකයෙක්, *Federal Court of Australia Act 1976*, 33 කොටස යටතේ කණ්ඩායම් ක්‍රියාවෙන්, ඉවත්වෙන බවට දැනුම් දීමක් කරයි.

දිනය: [උදාහරණ 19 ජූනි 20..]

ඔබේ අත්සන:

ඔබේ සම්පූර්ණ නම:

උපන් දිනය:

ඊමේල් ලිපිනය:

දුරකථන අංකය:

**රවුම් කරන්න:** කණ්ඩායම් සාමාජිකයා හෝ කණ්ඩායම් සාමාජිකයෙකු සඳහා නීතිමය භාරකරු හෝ කණ්ඩායම් සාමාජිකයෙකු <u>නොවෙයි</u>